නාට්‍ය හා රංග කලාව 06 - 07 ශ්‍රේණි

# අනුකරණය හඳුනා ගනිමු

## අනුකරණය හඳුනා ගනිමු

අනුකරණයක් යනුවෙන් හඳුන්වන්නේ කිසියම් ක්‍රියාවක් හෝ සිදුවීමක් හෝ ස්වභාවයක් ඒ අයුරින්ම සිදු කර පෙන්වීමයි.

තවත් ආකාරයකින් කියහොත් අනුකරණය යනු කිසියම් චරිතයක් ,සිද්ධියක් ,භූමිකාවක් පිළිබඳව නිරීක්ෂණයෙන් ලබා ගන්නා තොරතුරු භාවිතා කරමින් එම චරිතය හෝ සිද්දිය හෝ භූමිකාව නැවත ඒ අයුරින්ම ඉදිරිපත් කර පෙන්වීමයි.

අනුකරණයේදී කිසිඳු නිර්මාණශීලීත්වයක් සිදුවන්නේ නැත. එහෙත් නාට්‍ය හා රංග කලාව හදාරන ළමුන් වශයෙන් මෙම අනුකරණ ක්‍රියාවලිය ඉතාමත් වැදගත් වෙයි.

නාට්‍ය රඟදැක්වීමට පුහුණුවක් ලබා ගැනීමට ඉන් හැකියාව ලැබෙයි.

අපට එදිනෙද ජීවිතයේදී අනුකරණය කළ හැකි චරිත බොහෝ ඇත,

01. දෙමව්පියන් ගේ භූමිකාව
02. ආච්චි අම්මා සහ සීයාගේ භූමිකාව
03. ගුරුවරයකුගේ භූමිකාව
04. රියදුරු මහතාගේ භූමිකාව
05. කොන්දොස්තර මහතාගේ භූමිකාව
06. වෛද්‍ය වරයාගේ භූමිකාව
07. හෙදියගේ භූමිකාව
08. මාළු වෙළෙන්දෙකුගේ භූමිකාව...........වැනි බොහෝ චරිත අනුකරණය කළ හැකිය.

කුඩා ළමුන් සෙල්ලම් ගෙවල් සෑදීම ,කෝම්පිට්ටු සෑදීම ,බෝනික්කන් නැළවීම වැනි ක්‍රියාවන්ද අනුකරණ අවස්ථාවන්ය.
මිනිසුන් මෙන්ම සතුන්ද අනුකරණ ක්‍රියාවන්හි යෙදෙයි. පුස් පැටවකු සතෙකු දඩයම් කරනවා මෙන් වෙනත් දෙයක් අල්ලමින් ක්‍රියා කිරීම පෙන්වා දිය හැකිය.

ඒ අනුව අපට සත්ව චරිතද අනුකරණය කිරීමක් කළ හැකිය .එසේම අපට පියවි ඇසට නොපෙනෙන අධිමානුශීය චරිතයන්ද අනුකරණය කළ හැකිය.
උදා:- සුරංගනාවියන්/ මායාවරුන්/ දෙවියන්/ යකුන්/ හොල්මන් වැනි චරිත...

පැවරුම

01. ඔබට එදිනෙද මුණ ගැසෙන චරිත වල රූප සටහන් අඳින්න.
02. එම චරිත වල ඔබට පෙනෙන සුවිශේෂී ලක්ෂණ ඇඳ ඇති රූපයට පහලින් සටහන් කරන්න.
03. අනුකරණය නාට්‍ය හා රංග කලාව හදරන සිසුන්ට වැදගත් වන්නේ කෙසේද යන්න පහදන්න.
04. අධිමනුශීය චරිත වල රූප සටහන් ඇද එක් එක් චරිත වල ඔබ අසා ඇති සුවිශේෂිතා ලියා දක්වන්න.
05. අධිමානුශීය චරිත හෝ සත්ව චරිත ඇතුලත් නව ජනකතාවක් නිර්මාණය කරන්න.